| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/SW/14/19/01-Circular | | 2021.03.17 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්,

සමෘද්ධි කළමනාකරුවන් / සමෘද්ධි සංවර්ධන නිළධාරින් වෙත.

## සමෘද්ධි සහනාධාරය සඳහා සුදුසුකම් ලබන පවුල් තෝරාගැනීම.

උක්ත ශිර්ෂය යටතේ 2021.02.11 දිනැති මගේ සමාංක දරණ සමෘද්ධි චක්‍රලේඛ අංක 2021/03 හා බැඳේ.

02. එහි 03 වන ඡේදයේ I කරුණට අනුව සමෘද්ධි සහනාධාර නොලැබී යන අවස්ථා ලෙස සඳහන් කර ඇති "රජයේ හෝ පෞද්ගලික අංශයේ ස්ථිර රැකියාවක් කරන සාමාජිකයෙකු පවුල් ඒකකය තුළ සිටීම" යන්න "රජයේ ස්ථිර රැකියාවක් කරන සාමාජිකයෙකු පවුල් ඒකකය තුළ සිටීම" ලෙස වෙනස් විය යුතු අතර, පුද්ගලික අංශයේ රැකියාලාභීන් සිටින **පහළ ජීවන තත්වයන්** සහිත පවුල් මෙයට ඇතුලත් නොවේ.

03. එම ඡේදයේම V කරුණ යටතේ දක්වා ඇති ග්‍රාමීය කමිටුව විසින් හඳුනාගනු ලබන **සැලකිය යුතු දෛනික ආදායම් ලබන පුහුණු ශ්‍රමිකයන් සහිත පවුල්** සඳහා සහනාධාර හිමි නොවන්නේ, මෙම චක්‍රලේඛයේ 04 වන ඡේදයෙහි සඳහන් සමෘද්ධි සහනාධාරලාභින් තෝරාගැනීමේදී සලකාබලනු ලබන නිර්ණායකයන් ද සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව වේ.

04. 07 වන ඡේදයේ සඳහන් ප්‍රතිලාභින් තෝරාගැනීම සඳහා පත්කර ඇති ග්‍රාමීය කමිටුව සඳහා **වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරී ඇතුළුව තවත් එක් සාමාජිකයෙකු,** සහනාධාර ලබා දීමට සුදුසු ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා ප්‍රමාණවත් වේ.

05. 08 වන ඡේදය යටතේ ප්‍රතිලාභී නාමලේඛණ සකස් කිරීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම් අංක 01 මඟින් හඳුන්වා දී ඇති පෝරමය පරිදි, **ලකුණු ලබාදීමක් අවශ්‍ය නොවන අතර, පොදු වේ එම නිර්ණායක සැලකිල්ලට ගෙන ප්‍රතිලාභී නාම ලේඛණ සැකසීම ප්‍රමාණවත් වේ.**

06. 12 වන ඡේදයේ සඳහන් අභියාචනා සලකාබැලීම වෙනුවෙන් එක් වසමකට ලබාදිය හැකි **සහනාධාර වටිනාකමින් 25% ක ප්‍රමාණයක්** ඉදිරිපත් වන අභියාචනා සැලකිල්ලට ගෙන ලබාදීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඉතිරිව තබා ගතයුතුය.

07. 13 වන ඡේදයේ 2021 පෙබරවාරි මස සිට ආරම්භ කල යුතු නව සමෘද්ධි සහනාධාරලාභින් තෝරා ගැනීමේ කාර්යයේදී තෝරාගන්නා ලද පවුල් සඳහා සමෘද්ධි සහනාධාර දීමනා ප්‍රධාන පත්‍ර පිරිනැමීමට ප්‍රථම, පවුල්වල තොරතුරු කලමණාකරණ මොඩියුලයට (CRM) ඇතුලත් කිරීම හා මාසික උපරිම වාර්තාවට ඇතුලත් කිරීමට අදාළව තෝරා ගත් ප්‍රතිලාභී විස්තර එක් එක් සහනාධාර වටිනාකම් අනුව දිස්ත්‍රික් අධ්‍යක්ෂ/ දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ සහිතව සකස් කර ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර, ලබාදිය හැකි ප්‍රතිපාදන පිළිබඳව අනුමැතිය ලබා ගත යුතු වේ. මේ වන විටත් මාසිකව සමෘද්ධි සහනාධාර ලබන පවුල් වෙත, සංශෝධන සිදු කරන තෙක් පෙර පරිදිම මාසික සහනාධාර මුදල් ලබාදිය යුතුය.

08. එම 13 වන ඡේදයේම "කිසියම් වසමකින් ඉවත්ව යන සමෘද්ධි සහනාධාර පවුල් සංඛ්‍යාවම නව සමෘද්ධි සහනාධාර ලබාදීමේදී එම වසමටම ලබාදීම අත්‍යාවශ්‍ය නොවන අතර, එම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුල වෙනත් වසමක සුදුසු ප්‍රතිලාභී පවුලක් වෙත එම සහනාධාරය ලබා දීමේ හැකියාව පවතින බව" සඳහන් වුවද, මින් ඉදිරියට වසමකින් ඉවත්ව යන සහනාධාර වටිනාකමට අනුව **නව සහනාධාර නිකුත් කිරීම, අදාළ ග්‍රාමනිළධාරී වසම තුල ප්‍රථමයෙන් සිදුකල යුතු අතර,** කිසියම් ග්‍රාමනිළධාරී වසමක සහනාධාර ලබාදීමට සුදුසු පවුල් නොසිටීනම් පමණක් එම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ වෙනත් ග්‍රාමනිළධාරී වසමක ප්‍රතිලාභියකු තෝරාගැනීමේ හැකියාව ඇත.

09. ඒ අනුව ඉහත සඳහන් වෙනස්වීම් වලට අනුකූලව කටයුතු කරන ලෙසට කාරුණිකව දන්වා සිටින අතර, මේ දක්වා සිදුකරන ලද සංශෝධනද ඇතුලත් නව සංශෝධිත උපදෙස් මාලාව ඉදිරියේ දී ඔබ වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

**ආර්. පි. බී. තිලකසිරි**
**අධ්‍යක්ෂ ජනරාල්**

**පිටපත් :-**

01. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ස
02. ලේකම්, ආර්ථික පුනර්ජීවය හා දරිද්‍රතාවය තුරන් කිරීමේ ජනාධිපති කාර්ය සාධන බලකාය - කා.දැ.ස.
03. රාජ්‍ය ලේකම් , සමෘද්ධි, ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයංරැකියා,
    ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය. - කා.දැ.ස
04. විගණකාධිපති,විගණකාධිපති දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
05. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
06. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ස.
07. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ. ක.ස.